සියළුම හිමිකම් ඇවිරිණි }
All Rights Reserved }

25.05.2025

# අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය, 2025
# General Certificate of Education (Ord.Level ) Examination, 2025

TERM TEST PAPER

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
BUSINESS & ACCOUNTING STUDIES

කාලය පැය 2.00

සැලකිය යුතුයි - • සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

01. රණතුංග තම මාසික ආදායමෙන් කොටසක් කෑම බීම සඳහා ද තවත් කොටසක් දරුවන්ගේ ඉගෙනීම කටයුතු සඳහා ද ඉතිරිය අලුත් නිවස ඉදි කිරීමේ කටයුතු වෙනුවෙන් ද වියදම් කරයි. මෙහි ඇති අවශ්‍යතා වන්නේ

01. ආහාර ,නිවාස , පාසල
02. කෑමබීම , නිවාස , පාසල
03. ආහාර ,නිවාස ,අධ්‍යාපනය
04. කෑමබීම, නිවාස , අධ්‍යාපනය

02. ගෘහනියක් තම වත්තේ වගා කළ එළවලු සිය පවුලේ පරිභෝජනය සඳහා යොදා ගනි මෙම කටයුත්ත හඳුන්වන්නේ

01. වක්‍ර නිෂ්පාදනය ලෙස ය
02. ප්‍රවාහන නිෂ්පාදනය ලෙස ය
03. ඍජු නිෂ්පාදනය ලෙස ය
04. කාණ්ඩ නිෂ්පාදනය ලෙස ය

Learning Resource Center
R
De Mazenod Coll
...ane

03. නිෂ්පාදිත මූලික වශයෙන් වර්ග කරනුයේ

01. ප්‍රාථමික හා ද්විතික
02. කෘෂි කාර්මික හා කාර්මික
03. ඍජු හා වක්‍ර
04. භාණ්ඩ හා සේවා

04. නිවැරදි තීරණ ගැනීම, සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් වන ................................ විසින් සිදු කරයි.

05. සාධාරණ වැටුපක් ලබා ගැනීම රැකියා සුරක්ෂිත බව ඇති කර ගැනීම ආදී අරමුණු සහිත ඇල්මැති පාර්ශවය වන්නේ ................................ ය.

06. පහත සඳහන් පද යුගල අතුරින් වඩාත් ම ගැලපෙන පද යුගලය තෝරන්න

01. ප්‍රාග්ධනය - ඛනිජ සම්පත්
02. ශ්‍රමය - නිෂ්පාදනය
04. ප්‍රාග්ධනය - යන්ත්‍රසූත්‍ර
03. භූමිය - ගොඩනැගිලි

07. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව හා අරමුණු දැක්වෙන පහත තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න

| ඇල්මැති පාර්ශව | | අරමුණු | |
|---|---|---|---|
| 1) | අයිතිකරුවෝ | A. | තීරණ ගැනීම |
| 2) | කළමනාකරුවෝ | B. | ව්‍යාපාරයේ අනාගත වර්ධනය |
| 3) | රජය | C. | නිෂ්පාදිත මිල කිරණය කිරීම |
| 4) | තරගකරුවෝ | D. | රැකියා අවස්ථා උත්පාදනය කිරීම |

1) BADC
2) ABCD
3) DABC
4) CBAD

08. 2022 අයවැය තුළින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල මුදලක් වෙන් කරන ලදි. මෙම ප්‍රකාශය තුළ ඔබ දකින ව්‍යාපාර පරිසරය තෝරන්න.

1) ආර්ථික පරිසරය
2) නෛතික පරිසරය
3) තාක්ෂණික පරිසරය
4) දේශපාලන පරිසරය

09. බාහිර පරිසර සාධක ඇතුලත් කාණ්ඩය තෝරන්න

1) අයිතිකරුවෝ/ සේවකයෝ/තරගකරුවෝ
2) අයිත්කරුවෝ/තරගකරුවෝ/ සැපයුම්කරුවෝ
3) ගනුදෙනුකරුවෝ/තරගකරුවෝ / සැපයුම්කරුවෝ
4) සැපයුම්කරුවෝ / සේවකයෝ /තරගකරුවෝ

පහත තොරතුරු ආශ්‍රයෙන් අංක 10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A. ලංකාවේ විෂම ආදායම් ව්‍යාප්තියක් දැකිය හැකිය.

B. දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යයි.

C. පොලී අනුපාතය පහත හෙලීම රටක සංවර්ධනයට රුකුලක් වේ.

D. විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම රටක සීඝ්‍ර සංවර්ධනයට උපකාර වේ.

10. ආර්ථික පරිසරයට ඇතුළත් සාධක වන්නේ,

1) A/D  2) B/C  3) C/D  4) A/C

11. ගෝලීය පරිසරය හා සම්බන්ධ සාධක ලෙස සැලකිය හැක්කේ,

1) B/D  2) A/B  3) B/C  4) A/C

පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද ලියා ලියා දක්වන්න.

12. පාරිභෝගික රුචිකත්වය, ආදායම් මට්ටම, සමාජ තත්ත්වය ආදිය කරුණු මත පාරිභෝගිකයන් විවිධ සන්නම් නාම (Brand Name) යටතේ භාණ්ඩ තෝරා ගනියි ..................

13. "ව්‍යාපාර සඳහා හිතකර දිරිගැන්වීම් ලබාදීම" ව්‍යාපාරයක' රජයෙන් අපේක්ෂා කරන දායකත්වකි .................

හිස්තැන් පුරවන්න

( කළමනාකරු / 2007 අංක 07 දරණ සමාගම් පනත / ලිඛිත ගිවිසුම / නීතිමය පුද්ගලභාවය / හවුල් ව්‍යාපාර/ උද්ධමනය )

14. ලාභ ලැබීමේ අරමුණින් පොදුවේ පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව .............................. ලෙස හැඳින් වේ.

15. රටක භාණ්ඩ හා සේවා වල මිල මට්ටම අඛණ්ඩව ඉහළ යෑම .................................... වේ.

16. හවුල් ව්‍යාපාරයක් ඇරඹීම සඳහා අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකුවත් සිටිය යුතු අතර උපරිම සාමාජිකයන් 20 ක් සිටිය යුතු බව ........................................................................ අනුව තීරණය කර ඇත.

17. වංචා වැළැක්වීමේ ආංඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය රු 1 000 ක් හෝ ඊට වඩා වැඩි නම් හවුල් ව්‍යාපාර.................................................. යටතේ පවත්වාගෙන යා යුතු වේ.

18. තනි පුද්ගල ව්‍යාපාර , හවුල් ව්‍යාපාර හා දෙපාර්තමේන්තු වල ........................................... නොමැති වීම අවාසියකි.

කෙටි පිළිතුරු සපයන්න

19. ව්‍යාපාර වර්ග කළ හැකි ආකාර 02 ක් දක්වන්න

1) ...........................................................................................................

2) ...........................................................................................................

20. අඛණ්ඩ පැවැත්මක් නොමැති ව්‍යාපාර 02 ක් සඳහන් කරන්න

1) ...........................................................................................................

2) ...........................................................................................................

Learning Resource Center
R
De Mazenod College
Kandana

14.05.2025

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2025

## First Term Test - Grade 10 - 2025

නම / විභාග අංකය : ..........................................................................................

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තරුෂ අ.පො.ස (උසස් පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිට විශ්ව විද්‍යාල වරම් නොලැබූ අයෙකි. ඔහු එම විෂය ධාරාව හැදෑරීම තුළින් ලත් දැනුම පදනම් කරගෙන "දිදුල LED" නමින් විවිධ මාදිලියෙන් හා විදුලිය තවදුරටත් අඩුවෙන් වැයවන ආකරයට විදුලි බල්බ නිෂ්පාදනය කිරීම ආරම්භ කළේය. ඒ සඳහා ඔහු තම පියා විසින් ආපසු නොගැනීමේ පදනම මත ලබාදුන් රුපියල් ලක්ෂයක මුදල හා වාණිජ බැංකු මගින් සුළු පරිමාණ ව්‍යාපාරිකයින් දිරිමත් කිරීමේ අරමුණින් ලබාදෙන රුපියල් ලක්ෂයක බැංකු ණය ද ව්‍යාපාරයට යෙදවී ය. තව ද නිෂ්පාදන කටයුතු සඳහා ඔහු පදිංචි නිවස අයත් ඉඩමේ භාවිතයට නොගන්නා ගොඩනැගිල්ලක් යොදා ගන්නා ලදි. විදුලි බල්බ අලෙවිය සඳහා තම පියාගේ කුඩා ලොරිය කුලී පදනමකින් තොරව භාවිතා කරයි.

(1) (i) තරුෂගේ ව්‍යාපාරයේ ප්‍රධානතම අරමුණ කුමක් ද?

(ii) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයට අයත් වේ ද?

(2) සිද්ධිය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| භාණ්ඩ වර්ගය | සන්නම් නාමය | තෝරා ගැනීමට හේතුව |
|---|---|---|
| විදුලි බල්බ | (i) .................................... | (ii) .................................... |

(3) සිද්ධියේ සඳහන් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය ලෙස හඳුනාගත හැකි දෑ දෙකක් සඳහන් කරන්න.

(4) තරුෂගේ ව්‍යාපාරය කෙරෙහි රජය විසින් දක්වන දායකත්වය කුමක් ද?

(5) LED බල්බ නව මාදිලිවලින් ඉදිරිපත් කිරීම අයත්වන පරිසරය කුමක් ද?

(6) ඉහත සිද්ධිය ඇසුරින් ශක්තීන් හා අවස්ථා සඳහා නිදසුන බැගින් ලියන්න.

(7) (i) තරුෂගේ ව්‍යාපාරය අරමුණ අනුව කුමන ව්‍යාපාර සංවිධානයට අයත් වේ ද?

(ii) එම ව්‍යාපාරය පරිමාණය අනුව කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?

(8) (i) තරුෂගේ ව්‍යාපාරයට ගනුදෙනුකරුවන්ගේ සිත් ඇදගන්නා නමක් යෙදීමට අදහස් කරයි. ඒ සඳහා සුදුසු ව්‍යාපාර නාමයක් ලියා දක්වන්න.

(ii) එම ව්‍යාපාර නාමය ලියාපදිංචි කරන්නේ නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ඉල්ලුම් පත්‍ර දෙක මොනවා ද?

(9) ව්‍යාපාර නාමය ලියාපදිංචි කළේ නම් එම ව්‍යාපාරයට අත්පත් කරගත හැකි වාසි දෙකක් ලියන්න.

(10) තරුෂගේ ව්‍යාපාරය දියුණු කරගැනීම සඳහා ණය පහසුකම් ලබාගත හැකි ආයතන දෙකක් නම් කරන්න.

**2.** (1) ව්‍යාපාරයක දැකිය හැකි ප්‍රධාන අරමුණු දෙක නම් කරන්න.

(2) මෙවර නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ 100m දුර දිවීමේ ඉසව්ව සඳහා පියුමි හංසිකා සහභාගි වෙමින් සිටිය දී ක්ලාන්ත වී ඇද වැටුනා ය. නිවාස භාර ගුරුතුමිය වහා ම ඇයට ප්‍රථමාධාර දීමට කටයුතු කළාය. ඉහත සිද්ධියේ සඳහන් අවශ්‍යතාවක් හා වුවමනාවක් ලියන්න.

(3) අවශ්‍යතා හා වුවමනා අතර දක්නට ලැබෙන වෙනස්කම් දෙකක් ලියන්න.

(4) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) නිෂ්පාදනයේ දී ආධාර කරගන්නා මිනිසා විසින් සකස් කර ගන්නා දෑ ප්‍රාග්ධනය නම් වේ.

(ආ) ගණකාධිකාරීවරු මනස වෙහෙසා වැඩ කරන පුද්ගලයෝ ශ්‍රමය යන නිෂ්පාදන සාධකයට අයත් වේ.

(ඉ) ව්‍යාපාරකට සම්පත් සපයන පුද්ගලයෝ එහි අයිතිකරුවෝ ය.

(ඊ) භාණ්ඩයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ දී පාරිභෝගික රුචිකත්වය සලකා බැලීම අවශ්‍ය නොවේ.

(5) තරිඳු සහ සුපුන් පාසලක් ඉදිරිපිට TS Book Shop නමින් ලිපිද්‍රව්‍ය වෙළඳසලක් පවත්වාගෙන යති. TS Book Shop හි ඇල්මැති පාර්ශව දෙකක් ලියන්න.

(6) රජය ව්‍යාපාර කෙරෙහි පනවන නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා ඇතිකර තිබෙන රාජ්‍ය ආයතන දෙකක් ලියන්න.

(7) අභ්‍යන්තර පරිසර සාධකයක් වන කළමනාකරුවෝ යන්න හඳුන්වන්න.

(8) සමෝද් තමා ජීවත්වන හික්කඩුව ප්‍රදේශයේ සිප්පිකටු ආදී ස්වාභාවික අමුද්‍රව්‍ය යොදා නිපදවූ නිෂ්පාදිත සංචාරකයන්ට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. එහි මුදල් අයකැමි ලෙස රුවිනි සේවය කරනු ලබයි.

(අ) ඉහත ඡේදයේ දැක්වෙන ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් සාධක 02ක් දක්වන්න.

(ආ) සමෝද්ගේ වෙළඳසැලට සිප්පිකටු ආශ්‍රිත නිෂ්පාදිත සපයනු ලබන අභිෂේක් අයත් වන ව්‍යාපාර පරිසරය කුමක් ද?

(9) තාක්ෂණික වෙනස්වීම් නිසා ව්‍යාපාරවල සිදුවූ වෙනස්කම් දෙකක් ලියන්න.

(10) ආර්ථික පරිසර සාධක දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

**3.** (1) කේවල ස්වාමි ව්‍යාපාර යන්න හඳුන්වා එහි වාසි දෙකක් ලියන්න.

(2) පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද, අසත්‍යය ද යන්න දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්යය නොවේ.

(ආ) හවුල් ව්‍යාපාරවල අවම සාමාජික සංඛ්‍යාව 02 ක් වන අතර උපරිමය සීමාවක් නොමැත.

(ඉ) සංස්ථාපිත සමාගම් සඳහා බලපාන පනතක් ලෙස 2007 අංක 17 දරණ පනත දැක්විය හැක.

(ඊ) රාජ්‍ය සංස්ථාවල ලියාපදිංචිය අනිවාර්ය වේ.

(3) ව්‍යාපාර සංවිධාන අරමුණ අනුව වර්ග කර දක්වන්න.

(4) අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව සමුපකාර සංවිධාන ක්‍රමයේ පවතින වාසි 02 ක් ලියන්න.

(5) "ව්‍යාපාර ක්ෂේත්‍රය පුළුල් වීමත් සමඟ ව්‍යවසායකයින් යෝග්‍ය ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී විවිධ නිර්නායක සොයා බලයි." පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීමේ දී හඳුනා ගත හැකි වර්ග දෙක කුමක් ද?

(6) (අ) සුළු, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී සලකා බලනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් සඳහන් කරන්න.

(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ දින කීයක් ඇතුළත ද?

(7) අනුරාධ පෙරේරා විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරය අනුරාධ ස්ටෝර්ස් නමින් ම පවත්වා ගෙන යනු ලබයි. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්යය ද? නැද් ද? යන්න දක්වන්න.

(ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 01)

(8) රාජ්‍ය දෙපාර්තමේන්තුවල වාසි දෙකක් ලියන්න.

(9) හවුල් ව්‍යාපාර සඳහා බලපාන නීතිමය අණපනත් දෙකක් ලියන්න.

(10) තනි පුද්ගල ව්‍යාපාරවලට සාපේක්ෂව හවුල් ව්‍යාපාර වල දැකිය හැකි වාසි දෙකක් ලියන්න.